අභ්‍යන්තර නිවේදන අංක - DFAR/EST/2025/003

# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ප්‍රධාන ගුවන් විදුලි නිලධාරී තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය

1. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ප්‍රධාන ගුවන් විදුලි නිලධාරී තනතුර සම්පූර්ණ කිරීම සඳහා, මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## 2. අයදුම්පත් යොමු කිරීම

මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත්,අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2025.04.23** දින හෝ එදිනට පෙර **"අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත,කොළඹ 10."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය. ඉල්ලුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගුවන් විදුලි නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම-2025"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල මෙම නිවේදනයේ අග දක්වා ඇති ආකෘතිය අනුව සකස් කර ගත යුතුය. එම ආකෘතියේ 01 සිට 11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස තම අයදුම්පත්‍රය පිටු 02 කින් විය යුතුය.

නියමිත සුදුසකම් සපුරා නැති හෝ සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලබන අතර, අයදුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

## 3. සුදුසුකම්

(අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ (MT-01) 2 වන කාර්යක්ෂමතා කඩඉම සමත්, ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුරේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් 2025.04.23 දිනට සම්පූර්ණ කරන ලද නිලධරයෙක් වීම.

## 4. බඳවා ගැනීමේ ක්‍රමය

ඉහත 03 ඡේදයේ සඳහන් සම්පූර්ණ කල යුතු දිනට සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලකුණු පටිපාටියට අනුව ලබා ගන්නා මුලු ලකුණු වල අනුපිළිවෙළ මත පුරප්පාඩු පුරවනු ලැබේ.

## 5. තනතුරට අදාළ වැටුප් ක්‍රමය

අදාල වැටුප් චක්‍රලේඛය: රා.ප.ච 10/2025

වැටුප් කේත අංකය : MN -03-2025

වැටුප් පරිමාණය : රු.52,250 – 10X800 – 11X1,190 – 10X1,320 – 10X1,350 – 100,045/-

## 6. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| | ලකුණු ලබා දීමේ නිර්ණායක | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1. | <u>සේවා පලපුරුද්ද</u><br><br>(ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයට අමතරව සම්පූර්ණ කර ඇති සේවා කාලයන් සඳහා පහත පරිදි ලකුණු දෙනු ලැබේ.<br>• වසරකට ලකුණු 12 බැගින්ද<br>• මාස 06 ට වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 02 බැගින්ද | | 50 |
| 2. | <u>පරිගණක හැකියාව</u> | | 25 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක අවුරුදු 01 කට නොඅඩු (පැය 1500 ක) තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 25 | |
| | තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 06 ක (පැය 720 ක) නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම | 15 | |
| | තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 03 ක (පැය 360 ක) නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම | 10 | |
| | (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| 3 | <u>භාෂා හැකියාව</u> | | 20 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද උපාධියක් සඳහා | 20 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ, රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි පිළිබඳ වසර 01 ක (පැය 1500) ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 12 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ, රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06 ක (පැය 720) සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 08 | |
| | (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| 4 | <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය</u> | | |
| | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා | | 05 |
| | | | **100** |

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
2025.04. 07.

**<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ප්‍රධාන ගුවන් විදුලි නිලධාරී තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම</u>**

**ආදර්ශ අයදුම්පත්‍රය**

1. නිලධාරියාගේ නම -
2. ස්ථිර ලිපිනය -
3. ජාතික හැඳුනුම්පත් අංකය -
4. ස්ත්‍රී/පුරුෂ භාවය -
5. දුරකථන අංකය -
6. ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුරට පත් වූ දිනය -
7. 2025.04.23 දිනට ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුරේ සේවා කාලය -
8. දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය -
9. පූර්වාසන්න වසර 05 තුල වැටුප් වර්ධක ලබා තිබීම පිළිබඳ විස්තර -

| අනු අංකය | වර්ෂය | වැටුප් වර්ධකය උපයාගත් දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ විසින් වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

11. පරිගණක සාක්ෂරතාවය

| අනු අංකය | පුහුණුව | ආයතනය | පාඨමාලාවට නියමිත පැය ප්‍රමාණය | ලබාගත් දිනය/සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

12. භාෂා කුසලතාවය

| අනු අංකය | භාෂා කුසලතාවය | ලබාගත් දිනය/සම්පූර්ණ කළ දිනය |
|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂාව | |

**අයදුම්කරුගේ සහතිකය:**

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව අනාවරණය වුවහොත් උක්ත තනතුර සඳහා මා නුසුදුස්සකු වන බවත් අසත්‍ය හා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවත් මම දනිමි.

දිනය : ............................ ............................................

ඉල්ලුම්කරුගේ අත්සන

**අංශ ප්‍රධානියාගේ සහතිකය:**

මෙම ඉල්ලුම්කරු වන..................................................................මයා/මිය/මෙනවිය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ........................ අංශයේ / දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ නිලධාරියෙකු / නිලධාරිණියක ලෙස දැනට සේවය කරන බවත්, ඔහු / ඇය මා ඉදිරිපිටදී ඉහත අත්සන් කරන ලද බවත් සහතික කරමි.

දිනය : ............................

අත්සන:..............................................

නම:..............................................

තනතුර:..............................................

නිලමුද්‍රාව:..............................................